# හිතුවක්කාර කුරුළු පැටියා



අනුකි සෙනායා ඒකනායක
3 A

කෘතියේ නම: හිතුවක්කාර කුරුලු පැටියා

කතෘගේ නම: අනුකි සෙනායා ඒකනායක

කතෘගේ වෙනත් කෘති :

- ආඩම්බර රෝස මල
- ලුමිණි බබා සහ ආච්චි
- මා සමඟ ගස් වැල්
- මල්ලී පුදුම වෙලා

කෘතිය පළකරන දිනය: 15.11.2023

**ISBN** අංකය: 978 - 624 - 206 - 572 - 4

# පිදුම

මා ඇති දැඩි කරමින් පාසල් යවන මගේ ආදරණීය
අම්මාටත්, අප්පච්චීටත්....

මට අකුරු කියාදෙන ආදරණීය ගුරු
දෙමාපියන්ටත් ....

හොඳ දේ කියා දෙමින් මා ආදරයෙන් රැක බලා
ගන්නා ආච්චීටත්, අත්තම්මාටත්, අත්තාටත්,
දිව්‍යලෝකයේ සිටින සීයාටත් ....

දඟ වැඩ කළත්, රණ්ඩු කළත් මට ආදරේ මගේ
පුංචි මල්ලීටත් ....

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිපිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නව්කරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලද් දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එකෝමත් එක ගමක කුරුළු අම්මා කෙනෙකුයි තාත්තා කෙනෙකුයි හිටියා. එක දවසක් කුරුළු අම්මා බිත්තරයක් දැම්මා. කුරුළු අම්මාටයි, තාත්තාටයි හරි ම සතුටුයි.





කුරුලු අම්මයි, තාත්තයි බිත්තරය

ආරක්ෂා කළා. නයා ආවත් කොටනවා.



ටිකක් කල් ගියා. බිත්තරය පිපිරුණා. කුරුලු අම්මාටයි, තාත්තාටයි හරි ම සතුටුයි.




දැන් කුරුලු පැටියා ටිකක් ලොකුයි.

ඒ නිසා කුරුලු අම්මා පැටියාව

පාසලකට දැම්මා.



කුරුළු පැටියා පාසල් ගියා. හොඳට

අකුරු ලිව්වා. පදක්කමක් ගත්තා.

ඒකට නරක ළමයි තුන්දෙනෙක් ඊරිසියා

කළා. ඒ තමයි හා පැටියා,

බලු පැටියා සහ මී පැටියා.



දවසක් හා පැටියයි, බලු පැටියයි,

මී පැටියයි හිත හිත හිටියේ කුරුළු

පැටියව නරක කුරුළු පැටියෙක්

කරන්නයි.

කුරුළු පැටියා අපේ යාළුවෙක් වුණොත්

අපිට නරක වැඩ උගන්නන්න පුළුවන්.

ඒ වගේම එයාට හිතුවක්කාර

කුරුළු පැටියා කියයි, හා පැටියා කිව්වා.

ඒක හොඳ අදහසක් බලු පැටියා කිව්වා.

ඒ වගේ ම ඔක්කොම එකතුවෙලා

කුරුළු පැටියව යාළු කරගෙන

නරක වැඩ ඉගැන්නුවා. දැන් කුරුළු

පැටියා නරක වැඩ කරන නිසා

හිතුවක්කාර කුරුළු පැටියා නමින්

සැඳුණා.

දවසක් හිතුවක්කාර කුරුළු පැටියයි

යාලුවො තුන්දෙනයි පාසල් යනවා

කියලා කැලේ පැන්නා. කැලෑවේ බිම

මිදි පොකුරක් වැටිලා තිබ්බා.

හිතුවක්කාර කුරුළු පැටියයි

යාළුවොයි රණ්ඩු වුණා.



හිතුවක්කාර කුරුළු පැටියා හොටෙන්

ඔළුවට ඇන්නා. යාළුවෝ ගල් ගැහුවා.

ඒ අතර නයෙක් ආවා.

යාළුවෝ තුන්දෙනාගේ කකුල් තුවාල

වුණේ නැති නිසා ඒ අය දිවුවා.



හිතුවක්කාර කුරුළු පැටියාගේ පිහාටු

තුවාල වුණ නිසා පියාඹන්න බැරි වුණා.

එහා පැත්තේ තිබ්බ වලකට කුරුළු

පැටියා වැටුණා. එයා කෑ ගැසුවා.

ඒ කටහඬ කුරුළු පැටියගේ අම්මටයි

තාත්තටයි ඇහුණා. කුරුළු පැටියගේ

අම්මයි තාත්තයි ඇවිත් පැටියව

බේරා ගත්තා. ඊට පස්සේ මෙහෙම

කිව්වා. "අයෙ නම් නරක වැඩ කරන්න

එපා" "මම කවදාවත් නරක වැඩ

කරන්නේ නෑ" කුරුළු පැටියා කිව්වා.


කීච් චීච්
කීච් බීච්



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023. 11 . 01